# ජන ඇදහිලි හා විශ්වාස මත නිර්මාණය වූ කාන්තා පුළුටු මැටි රූප පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් (පොළොන්නරුව ආළාහන පිරිවෙන් කැණීම් භූමිය ආශ්‍රයෙන්)

**උල්පතගම අමිතරතන හිමි[1], ගල්වැවේ විමලබන්ති හිමි[2], රදාවානේ සිරිසුමංගල හිමි[3]**

## හැඳින්වීම

කාන්තා මැටි පුළුටු රූප යනු ශ්‍රී ලංකාවේ ප්‍රාග් සහ මූල (Historical (Proto-historic) මෙන් ම ඓතිහාසික යුගයට අයත් පුරාවිද්‍යාත්මක සාධක අතර සුවිශේෂී තැනක් ගන්නා කලා නිර්මාණ විශේෂයකි. මෙම රූප මගින් එදිනෙදා ජීවිතය ආගමික ඇදහිලි අභිචාර විධි (Rituals) සහ එකල සමාජයේ කාන්තාවට හිමිව තිබූ ස්ථානය පිළිබඳව වැදගත් තොරතුරු රැසක් අනාවරණය වේ.

## පර්යේෂණ අරමුණ

ශ්‍රී ලංකාවේ වාසය කළ ජන කණ්ඩායම් ටෙරකොටා, මැටි කාන්තා පුළුටු රූප භාවිත කිරීමේ සංස්කෘතික වැදගත්කම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. එමෙන් ම පර්යේෂණ කලාප ආශ්‍රිත ගවේෂණය හා කැණීම් කොට පාදාගත් කාන්තා මැටි රූප පිළිබඳ අධ්‍යයනය කිරීම.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලාංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට අනුරාධපුර හා පොළොන්නරු යුග දක්වා විවිධ ප්‍රදේශයන්හි නිර්මාණය කරන ලද කාන්තා පුළුටු මැටි රූප කුමන කාර්යයක් සඳහා භාවිත කළේ ද? ඒවා ශ්‍රී ලංකාවේ පැරණි ජන සමාජය කෙරෙහි ඇති කළ බලපෑම කවරේ ද? යන්න මෙහි දී සොයා බලනු ලබයි.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණයකින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා විධිමත් පර්යේෂණ ශිල්ප ක්‍රම යොදාගත යුතු බැවින් මෙම අධ්‍යයනයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මූලික වශයෙන් භාවිත කරනු ලැබේ. පුස්තකාල අධ්‍යයනය, ක්ෂේත්‍ර ගවේෂණය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සස්කෘතික අරමුදල සතු කැණීම් භූමිවලින් හමු වී ඇති කාන්තා පුළුටු රූප අධ්‍යයනය හා විශ්ලේෂණය කිරීම යන ක්‍රමවේද මෙහි දී භාවිත කරන ලදී.

1 ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය. umitharathana@gmail.com
2 සමාජවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. wimalk@busl.ac.lk.
3 සමාජවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. sirssumangala80@gmail.com

**සාකච්ඡාව**

ශ්‍රී ලංකාවෙන් හමුවන පුළුටු මැටි රූප හෙවත් ටෙරාකොටා ගැමි ජන සංස්කෘතියක් නියෝජනය කරනු ලබයි. මෙම පුළුටු මැටි රූප ශ්‍රී ලංකාවේ වියළි කලාපය ආශ්‍රිතව හමු වේ. දෛනික ජීවිතයේ කෘෂිකර්මාන්තය පදනම් කොට ගෙන තම ජීවිකාව පවත්වාගෙන ගිය මානවයන් නොයෙක් ඇදහිලි හා විශ්වාස පදනම් කරගෙන පුළුටු මැටි රූප නිර්මාණය කර ඇත. මෙම කාන්තා රූප, මැටියෙන් සකස් කර පුළුස්සාගෙන ඇති බැවින් මැටි රූප, ටෙරාකොටා රූප වැනි නම්වලින් භාවිත වේ. පදම් කළ මැටිවලින් විවිධ රූප නෙළා, ඒවා තද අව්වේ වියළා, පසුව පෝරණුවක හෝ විවෘත ගින්නක පුළුස්සා ගැනීමෙන් මෙම නිර්මාණ සකස් කර ඇත. ලංකාවේ ටෙරාකොටා නිර්මාණ පිළිබඳ කෙරී ඇති සමීක්ෂණ අල්ප වීම හේතුවෙන් මෙම ගණයේ නිර්මාණ පිළිබඳ පොදු අවධානය ලැබී ඇත්තේ මඳ වශයෙනි. මෙම කාන්තා මැටි රූප ශ්‍රී ලංකාවේ වියළි කලාප ආශ්‍රිතව එනම් සීගිරිය, ඉබ්බන්කටුව, දඹුල්ල, අනුරාධපුර, පොළොන්නරුව, වව්නියාව, තිස්සමහාරාමය, අකුරුගොඩ, ඉනාමළුව, රොටවැව, තබ්බෝව, මරදන්මඩුව, ගල්කැටිදමන, කිළිනොච්චිය, ඇලහැර, රාජාංගනය ආදී ස්ථානවලින් ලැබී ඇත. එබැවින් මෙම රූප කලාව වියළි කලාපීය සංස්කෘතියක් බවට සැකයක් නැත. මේවා අතර මානව රූපී නිර්මාණ සහ මානව රූපී නොවන නිර්මාණ හමු වී තිබේ. මානව රූපී නොවන සත්ත්ව රූප සහ හඳුනාගත නොහැකි ටෙරාකොටා නිර්මාණ ද ලැබී ඇත. පුළුටු මැටි රූප හෙවත් ටෙරාකොටා රූප කලාවේ කාල වකවානු පිළිබඳව විවිධ අදහස් පවතී. සීගිරිය-අලකොළවැව රූප ක්‍රි.ව. 3-5 සියවස් අතරටත්, මානාවැව හා උතුරු දොරටුව අවටින් හමු වූ රූප ක්‍රි.ව. 13-18 අතරටත් කාලනිර්ණය කර ඇත (දොඩම්වල, 1998 : 6). තබ්බෝව-මරදන්මඩුව රූප ක්‍රි.පූ. 300 - ක්‍රි.ව. 200 අතරටත්, මෙවැනි රූප සම්බන්ධයෙන් විධිමත් කැණීම් බිමක් වූ රන්දෙණිගමෙන් හමු වූ රූප ක්‍රි.ව. 370-1275 අතරටත් කාලනිර්ණය කර ඇත්තේ ය (Deraniyagala, 1997 : 33). ඒ අනුව ක්‍රි.ව. 3 සියවස පමණ සිට 13 වන සියවස දක්වා මෙම සංස්කෘතිය අඛණ්ඩව පැවත ඇති බව දක්නට ලැබේ.

ප්‍රාග් මහින්ද යුගයට පෙර මිනිසා තුළ පැවැති ජන ඇදහිලි හා විශ්වාස මත නිර්මාණය කරන ලද ටෙරාකොටා මූර්ති රැසක් ආලාහන පිරිවෙන් භූමියෙන් හමු වී තිබේ. මෙම ස්ථානයෙන් හමු වී ඇති ටෙරාකොටා මූර්ති තැන්පත් කර ඇති ආකාරය සහ ඉරි තැලී හා කැඩී බිඳී ඇති ආකාරය දෙස බැලීමේ දී පෙනී යන්නේ විනාශයට පත් වීමෙන් පසු මෙම ස්ථානයට ගෙනවිත් දමා ඇති බවත් ය. මෙහි දී විවිධ කාන්තා රූප රැසක් සොයා ගැනීමට හැකි වූ අතර යම්කිසි සංකේතාත්මක අර්ථයක් මේ තුළ ගැබ්ව තිබේ. මෙම ටෙරාකොටා මූර්තිවල කලාත්මක ලක්ෂණ දක්නට නොමැත. කාන්තා රූප දෙස බැලීමේ දී ඒවා යක්ෂණී රූපවලට සම කළ හැකි අතර මනුෂ්‍ය රූපයැ'යි හඳුනාගත නොහැකි තරමටම විකෘති වී ඇත. ඇතැම් ටෙරාකොටා මූර්ති දෙස බැලීමේ දී පයෝධර දක්වා නොතිබුණේ නම් වැදිරි රුවක් යැයි අර්ථකථනය කළ හැකි ය. මැටි ගුලි රැගෙන මෙහි දී ශරීරයේ විවිධ අංගෝපාංග යෙදුව විනා මූර්තියේ සමතුලිත බව හා ස්ත්‍රියකගේ ලාලිත්‍ය හුවා දැක්වීමෙන් රසාස්වාදයක් ජනිත කිරීමට උත්සහා නොගෙන අදෘශ්‍යමාන බලවේගයක පිහිටාධාරයක් අපෙක්ෂාවෙන් සිදු කරන්නට ඇතැයි සිතිය හැකි ය. මැටි මූර්ති දෙස බැලීමේ දී ඇස්, මුව, පියයුරු, කලවා, කන් හා තට්ටම් ප්‍රදේශය වඩාත් ඉස්මතු කර දක්වා ඇති බැවින් සශ්‍රීකත්වය ඒ තුළින් ජනිත වේ. මැටි ගුලි ගෙන

අතින් සකස් කරමින් අවයව අලවා නිර්මාණය කර ඇත. ආභරණ සහ සැරසිලි බෙල්ලට දමන ලද මාල, අත් වළලු, පාදවල පැළඳි නූපුර මෙන් ම ඉතා සංකීර්ණ සහ විවිධාකාර හිස සැරසිලි මෙම රූපවල දැකගත හැකිය. පුන් පියොයුරු සෞභාග්‍යයේ සංකේතයකි. එයින් ''කිරි'' යන අදහස පිළිබිඹු කරයි. ළදරුවන් පෝෂණය කිරීමට මව්කිරි තරම් රස ගුණ පිරි පෝෂ්‍යදායි ආහාරයක් මෙතෙක් සොයාගෙන නැත. නිරෝගීමත්, බුද්ධිමත් හා ශක්තිමත් පරපුරක් මත රටක සමෘද්ධිය රඳා පවතින නිසා මේ උදාර කාර්යයභාරය මව වෙත පැවරී ඇත. එමෙන් ම පුන් පියයුරු ඇති ළඳුන් දැකීම සුභ දසුනක් ලෙස වර්තමාන සමාජයේ ද පිළිගන්නා අතර ඇතැම් ප්‍රදේශවල කිරි ඇති ළඳක විසින් අටුවට ශෂ්‍ය තැන්පත් කිරිමේ ශුභ ඵලදායි ලෙස විශ්වාසයක් පවතී (විජේරත්න, 1996 : 24).

කාන්තා පුළුටු මැටි රූප දෙස බැලීමේ දී ජගත් මාතා වන්දනා ක්‍රමයක් පවතින්නට ඇති බවට සිතිය හැකි ය. මාතෘ දෙවගන, පෘථිවි නැතහොත් ජගත් මාතා වශයෙන් පෙනී සිටි ඇය විවිධ තැන්හි දී විවිධ නමින් හැඳින්විණ. බැබිලෝනියාවේ ඉෂ්තාර් (Ishtar), පෙයිනීසියාවේ ඇස්ටාර්ටේ (Astarte), ඊජිප්තුවේ අයිසිස් (Isis), සේ හැඳින් වූයේ මෙම සංකල්පයම ය. යුරෝපයේ වීනස්ගේ රූපයෙන් හැඳින් වෙන්නේ ද මෙයම ය. ග්‍රීසියේ මෙම අදහස දැරූ අය බොහෝ විය. කුරෝස්ටොපස් (Kovros Tropes) ඉන් ප්‍රධාන අදහසකි. ඉන්දියාවේ ද ග්‍රීසියේ මෙන් මෙය පිළිබඳ සංකීර්ණතාවක් දක්නට හැකි ය (Chandnda 1973 : 5). පණ්ඩුකාභය රජු කල වළාමුඛී නම් යකින්න ජගත් මාතා, මිහිකත, කාලිදේවී යන නම්වලින් ද හඳුන්වා ඇති අතර ජගත් මාතා අතීත ලෝකයේ හැම රටක ම වාගේ කෘෂකයන් විසින් කාමෝත්සවයෙන් පිදූ දෙවගනකි. සශ්‍රීකත්වය සඳහා මැය පුදනු ලැබීය.

ආළාහන පිරිවෙන පරිශ්‍රයේ තිබී හමු වූ මෙම ටෙරාකොටා මූර්ති අතර සමූහ මූර්ති දෙකක් ඇත. දරන කෙසඟ ශරීර හයක් ඇති ස්ත්‍රී රූප දෙස බැලීමේ දී මෙහි හත්වන රූප ගැලවී ඇති බවක් පෙනෙන අතර මෙය තුළින් සප්ත මාතිකා සංකල්පය නිරූපණය විය හැකි බව ප්‍රේමතිලක මහතා අදහස් දක්වා ඇත. ස්ත්‍රී රූප තුනක් සහිත මූර්තියක් ලැබී ඇති අතර වම්පස කොටස කැඩී ඇති බැවින් මෙහි ද තව රූප කිහිපයක් තිබෙන්නට ඇති බව සිතිය හැකි ය. දැනට කොළඹ කෞතුකාගාරයේ මීට පෙර ලැබී ඇති සප්ත මාතිකා සංකල්පය නිරූපණය වන ටෙරාකොටා තැන්පත් කර ඇත.

ලක්ෂ්මී, මහේෂ්වරී, කෞමාරි, බ්‍රහ්මනි, වරාහී ආදී මවුවරුන් සත් දෙනා නිරූපණය වන බවත් මෙවැනි සමාන ටෙරාකොටා මූර්ති අනුරාධපුර මිහින්තලය යන ස්ථානවලින් ලැබී ඇත. සප්ත මාතිකා සංකල්පය පසු කාලීනව විකාශනය වී ජන සමාජය තුළ දක්නට ලැබෙන ශාන්ති කර්මයක් ලෙස කිරි අම්මාවරුන්ගේ දානය වුවා විය හැකි ය. ලංකාවේ සෑම ප්‍රදේශයකම දක්නට ලැබෙන අතර ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණික වූ ලක්ෂණ දක්නට ලැබේ. පත්තිනි දේවිය මුල් කරගෙන කාන්තාවන් සත් දෙනක් කිරි අම්මා වරුන්ගේ දානය සිදුකරනු ලබයි. සරම්ප, කම්මුල්ගාය, පැපොල ආදී ලෙඩ රෝග සඳහා ද ගොවිතැන් කටයුතු, විභාගයකට පෙනී සිටීම, ගැබ් ගත් කාන්තාවක් ආරක්ෂා වීම, අසාධ්‍ය රෝගියෙකු සුවපත් කරවා ගැනීමට ආදී අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ පර්මාර්ථයෙන් කිරි අම්මා වරුන්ගේ දානය පැවැත් වේ. හින්දු ආගමේ දැඩි බලපෑම පොළොන්නරුව යුගයේ දී බහුලව දක්නට ලැබේ. සප්ත මාත්‍රිකා, කාලි දෙවඟන, කාරෙක්කාල් අම්මෙයියාර් නිරූපණය වන ලෝකඩ මූර්ති ද විරූපීව නිර්මාණය

කර ඇති බැවින් ටෙරාකොටා මූර්තිවලට ද එවැනි දෙවඟනන් නිරූපණයට උත්සහ කළා විය හැකි ය. කාන්තා පුළුටු මැටි රූප දෙස බැලීමේ දී ජගත් මාතා වන්දනය, සප්ත මාතිකා සංකල්පය, යෝනි වන්දනය හා විවිධ කාන්තා දේවතාවියන් පුද ලැබීමට නිරූපණය කළා යැයි උපකල්පනය කළ හැකි ය. පුළුටු මැටි රූපවලින් ශිව ලිංග හා යෝනි වන්දනය, ජගත් මාතා වන්දනය, සප්ත මාතිකා සංකල්පය, සත්ත්ව වන්දනාව ගණදෙවි වන්දනා ආදී නොයෙක් හින්දු ඇදහිලි හා විශ්වාසයන් දක්නට ලැබෙන බවත්, මෑතකාලීනව රජරට ප්‍රදේශවල ශිව ලිංග, ගණදෙවි, පත්තිණි දේව වන්දනය දැකිය හැකි ය. ශ්‍රී ලංකාවේ ද දේශීය ඇදහීම් රටාවන් තුළ මාතෘ දේවී වන්දනාවේ ආභාසය පැහැදිලිව හඳුනාගත හැකි ය. ලාංකීය සමාජයේ වඩාත්ම ජනප්‍රිය මාතෘ දේවී ස්වරූපය පත්තිනි වන්දනාව යි. සශ්‍රීකත්වය, වසංගත රෝගවලින් ආරක්ෂාව සහ දරු සම්පත් අපේක්ෂාවෙන් පත්තිනි මෑණියන් උදෙසා ගම්මඩු, දේවතොවිල් පවත්වනු ලැබේ. දඩයම් යුගයේ සිට කෘෂිකාර්මික යුගය දක්වා මිනිසා පෘථිවිය සහ ස්වභාව ධර්මය, මවක ලෙස සලකා ගෞරව දැක්වීම මාතෘ දේවී වන්දනාවේ මූලික පදනම යි.



පොළොන්නරුව ආළාහන පිරිවෙන් කැණීම් භූමියෙන් හමු වී ඇති පුළුටු මැටි රූප

**ප්‍රතිඵලය**

කාන්තා පුළුටු මැටි රූප දෙස බැලීමේ දී ජගත් මාතා වන්දනය, සප්ත මාතිකා සංකල්පය, යෝනි වන්දනය හා විවිධ කාන්තා දේවතාවියන් පුද ලැබීමට නිරූපණය කළා යැයි උපකල්පනය කළ හැකි ය. ඒ තුළින් මානව ජන සමාජය තුළ සශ්‍රීකත්වය, වසංගත රෝගවලින් ආරක්ෂාව සහ දරු සම්පත් අපේක්ෂාවෙන් මෙම කාන්තා මැටි රූප නිර්මාණය කර අභිචාර ක්‍රමයක් ලෙස භාවිත කොට තිබේ.

**සමාලෝචනය**

ලෝකයේ බොහෝ පැරණි ශිෂ්ටාචාරවල මෙන් ම ලංකාවේ ද ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ''මව් දෙවඟන'' ඇදහීමේ සිරිතක් පැවති බවට මෙම කාන්තා පුළුටු රූප ප්‍රබල සාක්ෂියකි. ජීවය දෙන, දරුවන් බිහිකරන මාතාව දේවත්වයෙන් සැලකීම මෙහි අරමුණ වී තිබේ. එමෙන් ම ගොවිතැනේ සශ්‍රීකත්වය, වැසි ලැබීම සහ සතුන් බෝවීම අපේක්ෂාවෙන් පැවැත් වූ යාතුකර්ම සඳහා මෙම මැටි රූප භාවිත කරන්නට ඇතැ'යි විශ්වාස කෙරේ. දැරණියගල පෙන්වා දෙන්නේ මේවා එකල පැවති ඇස්වහ, කටවහ හෝ ලෙඩ රෝග සුවකිරීමේ අභිචාර සඳහා ''බිලි රූප'' ලෙස භාවිත කර පසුව විනාශ කර දමන්නට ඇති බව ය. බොහෝවිට මේවා කැඩී බිඳී ගිය කොටස් ලෙස හමුවීමට එය ද හේතුවක් විය හැකි ය. මෙම ටෙරකොටා කාන්තා පුළුටු රූප පිළිබඳ හැදෑරීම ක්ෂේත්‍ර කිහිපයකට වැදගත් වේ. පැරණි ලංකාවේ කාන්තාවන් භාවිත කළ ආභරණ, ඇඳුම් මෝස්තර සහ හිසකෙස් සකස් කළ ක්‍රම හඳුනා ගැනීමට. එකල දේශීය කලාකරුවා මැටි පදම් කිරීම, හැඩගැන්වීම සහ ඒවා නිවැරදි උෂ්ණත්වයක පුළුස්සා ගැනීම පිළිබඳ ලැබ තිබූ තාක්ෂණික ඥානය වටහා ගැනීමටත්, බුදුසමය ලංකාවට පැමිණීමට පෙර සහ ඉන් පසුවත් ජන සමාජයේ යටිපෙළේ පැවති ලෞකික ඇදහිලි සහ අභිචාර විධි තේරුම් ගැනීමටත් මේ තුළින් හැකි වේ.

**ප්‍රමුඛ පද** - අභිචාර විධි, පුළුටු මැටි රූප, ටෙරාකොටා මූර්ති, සශ්‍රීකත්වය

**ආශ්‍රිත ග්‍රන්ථ**


විජේරත්න යූ.ඩී, (1996). *ආලාහන පිරිවෙන් කැණීමෙන් ලැබුණ ස්ත්‍රී මැටි මූර්ති.* සංස්කෘතික පුරාණය. 2 වෙළුම. 3 කලාපය. මධ්‍යම සංස්කෘතික අරමුදල. ජුලි, සැප්තැම්බර්.

Deraniyagala S.U. (1972). The citadel of Anuradhapura 1969 Excavations in the Gedige Area. Ancient ceylon. No 2. *Journal of the Archaeological Survey Department*.Sri lanka.

Moti chandndra. (1973). *Studies in tho cult of the mother Goddess in Ancient India*. prince of wales Museum Bullatin.